
සමාජ සේවා දෙපාර්තමේන්තුව
சமூக சேவைகள் திணைக்களம்
Department of Social Services








# කාර්ය සාධන වාර්තාව
# செயற்பாட்டு அறிக்கை
# PERFORMANCE REPORT
# 2015

# කාර්ය සාධන වාර්තාව
# 2015

## සමාජ සේවා දෙපාර්තමේන්තුව


දෙවන මහල

සෙත්සිරිපාය - II අදියර

බත්තරමුල්ල

| | |
|---|---|
| දුරකථන | : 0112187050 |
| ෆැක්ස් | : 0112186276 |
| ඊ - මේල් | : dirss@sltnet.lk |
| | dirssdss@gmail.com |
| වෙබ් අඩවිය | : www.socialservices.gov.lk |

# පටුන

පිටුව


- සමාජ සේවා අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය **i**
- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, තේමාව හා වටිනාකම් **ii - iv**
- කාර්ය මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය **v - vi**
- **1** වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රගතිය **1 - 6**
- **2** වන පරිච්ඡේදය - ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන වැඩසටහන **7 - 18**
- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම
- ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය
- ජාතික ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
- **3** වන පරිච්ඡේදය - මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය **19 - 20**
- **4** වන පරිච්ඡේදය - පුහුණු වැඩසටහන් හා පුහුණු පාඨමාලා **21 - 23**
- **5** වන පරිච්ඡේදය - විදේශ ආධාර ව්‍යාපෘතිය හා විශේෂ වැඩසටහන් **24 - 26**

## සමාජ සේවා අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව 2015 වර්ෂයේ සමාජයේ අවාසි සහගත තත්ත්වයන්ට හා පීඩනයන්ට පත් වූ ජන කොටස්වලට සහන සැලසීම ,පුනරුත්ථාපනය කිරීම, එවැනි තත්ත්වයන්ට පත්වීම වැළැක්වීම හා එම කොටස් සවිබලගන්වමින් සමාජ සංවර්ධනයට දායක කරවීම සම්බන්ධව 2015 වර්ෂයේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක සිදු කිරීමට හැකි විය.

ආබාධ සහිත තත්ත්වයෙන් පසුවන තැනැත්තන්ගේ මානව හිමිකම් සුරක්ෂිත කරමින් ආත්මගරුත්වයෙන් යුතුව නැගී සිටිමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව සලසා දීමේ අරමුණු පෙරදැරි කොට විවිධ වැඩසටහන් 2015 වර්ෂයේ ක්‍රියාත්මක කොට ඇත.

ආබාධ සහිත පූර්ව ළමාවියේ දරුවන් සංවර්ධන කිරීම සඳහා කල්තියා මැදිහත් වීමේ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම, ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීය හැකියවන් වැඩි දියුණු කිරීම හා සමාජ ගත කිරීම , රාජ්‍ය හා පුද්ගලික අංශවල රැකියා අවස්ථා හඳුන්වා දීම ,චිකිත්සක සේවා සඳහා යොමු කිරීම, ඍජු ප්‍රතිලාභ ලබාදීම හා ස්වශක්ති කණ්ඩායම් බල ගැන්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ වැඩ කොටස් ලෙස හඳුන්වාදිය හැක.

මත්ලෝලීන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම, මහජන ඉල්ලීම් සඳහා අවශ්‍ය සේවා ලබාදීම, පුණ්‍යායතන හා රාජ්‍ය නොවන සංවිධානවල ඉල්ලීම් සඳහා අවශ්‍ය සේවා ලබාදීම මගින් සතුටුදායක මට්ටමකට ගෙන ඒමට හැකිවිය.

සමාජ සවිලබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංය මගින් 2015 වර්ෂයේ හතරවන කාර්තුවේ දී ආබාධ සහිත දරුදැරියන්ගේ කුසලතා සංවර්ධන කිරීම සඳහා වූ විශේෂ වැඩසටහන සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ වෘත්තීය පුහුණු ආයතනවල විධිමත් ලෙස පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන්ගෙන් තෝරාගත් අභ්‍යාසලාභීන් පිරිසක් නිෂ්පාදන ක්‍රියාවලියකට යොමු කිරීම, ප්‍රාදේශීය මට්ටමින් අබාධ සහිත ළමුන්ගේ ස්වයංරැකියා පුහුණුව සඳහා ආධාර දීම, ආබාධ සහිත දරුදැරියන්ගේ කලා කුසලතා කරලියට ගෙන එම හා යහපත් ශරිර සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙන යාම සඳහා ක්‍රිඩා කෞශල්‍යය වැඩි දියුණු කිරීම , ආබාධ සහිත දරුදැරියන් සඳහා කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම හා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම, දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින්ගේ අත්දැකීම් පදනම් කරගනිමින් සිද්ධි අධ්‍යන ග්‍රන්ථ දෙකක් මුද්‍රණය කිරීම, ආබාධ සහිත ළමුන්ගේ ක්‍රියාකාරකම් වීඩියෝ ගත කිරීම , ව්‍යායාම හා සංගීත උපකරණ මිලදී ගැනීම සිදුකොට ඇත.

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි අලුත්වැඩියාවන් කිරීම , වෘත්තීය පුහුණු ආයතන නවීකරණය කිරීම හා අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ මිල දී ගැනීමද, විශේෂයෙන් මිලියන 100 ව්‍යාපෘතිය යටතේ ආබාධ සහිත වූවන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතන නවීකරණය කිරීම හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමද ඉතා සතුටුදායක මට්ටමකට සිදුවිය.

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා යොමු කිරීම 2015 වර්ෂයේ සිදුකර ඇත.

2015 වසර සඳහා ඉදිරිපත් කළ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 426,658,000ක් ලැබුණු අතර,සේවා අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා රුපියල් මිලියන 407,117,267ක් වියදම් කොට ඇත.මූලධන වියදම් සඳහා මහා භාණ්ඩාගරයෙන් රුපියල් මිලයන 177,872,000ක් වෙන්වූ අතර වර්ෂය තුලදී අදාල කාර්යන් සඳහා රුපියල් මිලයන 140,909,491ක් වැය විය.

මෙම සේවාවන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා සේවක පිරිස ඉතා කැපවීමෙන් හා ඉතා උනන්දුවෙන් කටයුතු කළ බව කෘතවේදීව සඳහන් කරමි. මේ හේතුව නිසාම 2015 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කයන් 91% ක් පමණ සපුරාගත හැකි විය. දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා කණ්ඩායමක් වශයෙන් දායක වූ කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින්ට ඉතා ස්තූතිවන්ත වෙමි.

**ප්‍රදීප් යසරත්න**
සමාජ සේවා අධ්‍යක්ෂ

## දැක්ම

**මානව සංවර්ධනයේ පෙර ගමන්කරුවීම**

## මෙහෙවර

**සමාජයේ වෙසෙන අවාසි සහගත තත්ත්වයට පත්වූවන්ට අවැසි සේවා සැපයීම හා බල ගැන්වීම තුළින් ඔවුන් සමාජ සංවර්ධනයේ සක්‍රීය කොටස්කරුවන් කිරීම.**

## තේමාව

**සතුට සපිරි අභිමානනීය සැබෑ මිනිසුන්ගෙන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩ නගමු**

## වටිනාකම්

01. සැමවිටම නොපැකිළව සේවය ලබා දෙමු.
02. ස්වයං විනය ආරක්ෂා කරමු.
03. අනෙකාට ගරු කරමු.
04. සේවාලාභීයාගේ අවශ්‍යතා වෙනුවෙන් කොන්දේසි විරහිතව කැප වෙමු .
05. අද කළ යුතු දේ අදම කරමු.
06. සේවාලාභීයගේ සතුට අපේ සතුට කර ගනිමු
07. ගවේෂණාත්මක විමර්ශනය තුළ සේවයට කැප වෙමු.
08. සෑම ගැටළුවකටම විසඳුමක් ලබා දෙමු.
09. අවදානමට පෙර සූදානම් වෙමු.
10. සමාජ ගැටළුවල මූල හේතුන්ට නිර්මාණාත්මක ප්‍රවේශයක් ලබාදෙමු.
11. යහපාලනයෙන් කටයුතු කරමු.
12. සහකම්පනයෙන් යුතුව වැඩ කරමු.
13. අපි එක පවුලක් මෙන් වැඩ කරමු.
14. මානව දයාව පදනම් වූ සේවාවක් පපයමු.
15. සැමගේ හැකියාව අගයමු.
16. සෑම නිමේශයක්ම සේවයට කැපකරමු.

# අරමුණු හා ක්‍රියාකාරකම්

## අරමුණු

- ආබාධ සහිත තැනැත්තන් සඳහා සමාන අවස්ථා සලසා දෙන බවට වග බලා ගැනීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම සහ ඔවුන් ස්වාධීන පුරවැසියන් බවට පත් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ ආර්ථික සුරක්ෂිතතාවය ඇති කිරීම හා යැපුම් මානසිකත්වය අවම කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල් තියා මැදිහත් වීම.
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
- ආබාධ සහිත පුද්ගලයන්ට නිදහස් සමාජයක ඵලදායීව සහභාගිවීමට හැකියාව ඇති කරවීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය, කුසලතා සහ නිර්මාණශීලීත්වය මෙන්ම මානසික හා කායික හැකියාවන් හැකි උපරිමය දක්වා සංවර්ධනය කිරීම.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට නංවාලීම.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන බල ගැන්වීම.
- මතට ඇබ්බැහිවූවන් සමාජගත කිරීම.

**ක්‍රියාකාරකම්**


- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත රැකියා සඳහා යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනා ගැනීම හා පුළුල් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනිමට පර්යේෂණ කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා ආධාරක උපකරණ සැපයීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත්වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- සේවා සපයන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවීම.
- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කරවීම.
- භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගේ සුභ සාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.

- වයස අවු. 60ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට පෙනීම ලබා දීම සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත දරුවන්ට ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබාදීම.
- ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබාදීම
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- ඒකාබද්ධ ප්‍රවේශය හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම.
- පුණ්‍යායතන ලියාපදිංචි තත්ත්වය ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම, ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා සහන ලබාදීමට නිර්දේශ කිරීම.

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2015-12-31

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් තලය | අනුමත සංඛ්‍යාව | | | දැනට සිටින සංඛ්‍යාව | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | අනියම | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම | කොන්ත්‍රාත් | |
| **ජ්‍යෙෂ්ඨ** | | | | | | | | | | |
| අධ්‍යක්ෂ | ශ්‍රී. ලං. ප.සේ. | I | SL 1-2006 | 1 | | | 1 | | | 0 |
| අතිරේක අධ්‍යක්ෂ | ශ්‍රී. ලං. ප.සේ. | I | SL 1-2006 | 1 | | | 1 | | | 0 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී. ලං. ග.සේ. | I | SL 1-2006 | 1 | | | 1 | | | 0 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ලං. ප.සේ. | II/ III | SL 1-2006 | 3 | | | 3 | | | 0 |
| ගණකාධිකාරි/අභ්‍යන්ත ර විගණක | ශ්‍රී. ලං. ග.සේ. | II/ III | SL 1-2006 | 2 | | | 0 | | | 2 |
| සමාජ සුබසාධන අධිකාරි | ස.සේ.දෙ. | III | SL 1-2006 | 3 | | | 3 | | | 0 |
| **තෘතියික** | | | | | | | | | | |
| පරිපාලන නිලධාරි | රා.ක.ස.සේ. සු.ප්‍රා. | | MN 7 -2006 | 1 | | | 0 | | | 1 |
| ස්ථානභාර නිලධාරි | ස.සේ.දෙ. | | MN 7 -2006 | 7 | | | 0 | | | 7 |
| සමාජ සේවා නිලධාරි | ස.සේ.දෙ. | I/ II/ III | MN 5 -2006 | 156 | | | 119 | | | - |
| **ද්විතියික** | | | | | | | | | | |
| සමාජ සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | | MN 4 -2006 | 200 | | | 195 | | | - |
| දෘශ්‍යාබාධිත සංවර්ධන නිලධාරි | ස.සේ.දෙ. | III | MN 4 -2006 | 13 | | | 11 | | | 2 |
| සංවර්ධන නිලධාරි | ස.නි.සේ. | | MN 4 -2006 | 184 | | | 167 | | | 17 |
| ආධුනික පරිවර්තක | ආශ්‍රිත සේවා | III | MN 4 -2006 | 1 | | | 0 | | | 1 |
| වැඩසටහන් නිලධාරි | ස.සේ.දෙ. | | MN 4 -2006 | 1 | | | 0 | | | 0 |
| වැඩ කළමනාකරු | ස.සේ.දෙ. | I/ II/ III | MT 3 - 2006 | 4 | | | 1 | | | 3 |
| වෘත්තීය උපදේශක | ස.සේ.දෙ. | III | MT 1 - 2006 | 51 | | 9 | 44 | | 5 | 7(කොන් .4) |
| තොරතුරු, සන්නිවේදන හා තාක්ෂණ සහකාර | තො.ස.තා.ස. සේ. | I/ II/ III | MT 1 - 2006 | 1 | | | 1 | | | 0 |
| රාජ්‍ය කළමනාකාර සහකාර | රා.ක.ස.සේ. | III | MN 2 -2006 | 44 | | | 38 | | | 6 |
| සංඥා භාෂා පරිවර්තක | ස.සේ.දෙ. | III | MN 1 -2006 | 7 | | | 6 | | | 1 |
| පෙර පාසල් ගුරු | ස.සේ.දෙ. | I/ II/ III | MN 1 -2006 | 3 | | | 3 | | | 0 |
| නිවාස පාලිකා | ස.සේ.දෙ. | I/ II/ III | MN 1 -2006 | 12 | | | 6 | | | 6 |
| **ප්‍රාථමික** | | | | | | | | | | |
| රියදුරු | රියදුරු සේ. | I/ II/ III | PL 3 - 2006 | 13 | | | 12 | | | 1 |
| අරක්කැමි | ස.සේ.දෙ. | I/ II/ III | PL 2 - 2006 | 6 | | | 6 | | | 0 |
| ළමා සංවර්ධන සහකාර | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 - 2006 | 5 | | | 5 | | | 0 |
| අරක්කැමි ( සහයක) | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 - 2006 | 12 | | | 11 | | | 1 |
| උපස්ථායක | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 - 2006 | 21 | | | 21 | | | 0 |
| කාර්යාල කාර්යය සහයක | කා.කා.සේ. | I/ II/ III | PL 1 - 2006 | 40 | | | 40 | | | 0 |
| පුනරුත්ථාපන සහයක | කොන්ත්‍රාත් | | | 0 | | 9 | 0 | | 6 | 3 |
| **එකතුව** | | | | **765** | | **18** | **666** | | **9** | **81** |

# සංවිධාන ව්‍යුහය
# සමාජ සේවා දෙපාර්තමේන්තුව



# 1වන පරිච්ඡේදය

## මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදන<br>රු. | වියදම<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්තන | 426,658,000 | 407,117,267 | 95.42% |
| ප්‍රාග්ධන | 177,872,000 | 140,909,491 | 79.22% |
| **එකතුව** | **604,530,000** | **548,026,758** | **90.65%** |

**වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන**
**ව්‍යාපෘතිය 01 - පරිපාලන හා ආයතන සේවා**
**පුනරාවර්තන වියදම්**

| කාණ්ඩය | 2015 වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | වියදම<br>රු. |
|---|---|---|
| පුද්ගල පඩි නඩි | 18,250,000 | 17,639,097 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 10,448,000 | 9,551,440 |
| **මුළු පුනරාවර්තන වියදම** | **28,698,000** | **27,190,537** |

**වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘතිය02 - සමාජ සේවාවන් සඳහා මුදල්**
**පුනරාවර්තන වියදම්**

| කාණ්ඩය | 2015 වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | 2015 වර්ෂයේ මුළු වියදම<br>රු. |
|---|---|---|
| පුද්ගල පඩි නඩි | 213,725,000 | 211,261,018 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 19,155,000 | 16,132,979 |
| **මුළු පුනරාවර්තන වියදම** | **232,880,000** | **227,393,997** |

**වැඩසටහන 02 - සවර්ධන වැඩසටහන**

**ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපනය හා පුහුණු කිරීම් සේවා**

**පුනරාවර්තන වියදම්**

| කාණ්ඩය | 2015 වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | 2015 වර්ෂයේ මුළු වියදම<br>රු. |
|---|---|---|
| පුද්ගල පඩි නඩි | 82,200,000 | 80,940,404 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 82,880,000 | 71,592,329 |
| මුළු පුනරාවර්තන වියදම | 165,080,000 | 152,532,733 |

## 2015 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ සීමාවන්

| | ඇස්තමේන්තු ගත සීමාවන් රු. | සත්‍ය සීමාවන් රු. |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 16,390,000 | 15,493,958 |
| අවම ලැබීම් සීමාව | 11,500,000 | 13,863,035 |
| උපරිම හර ශේෂ සීමාව | 75,000,000 | - |

## 2015 වර්ෂයේ ආදායම් ඒකරාශී කිරීම

| ආදායම් සීමාව | සත්‍ය ආදායම රු. |
|---|---|
| 2002-01-01 රජයේ ගොඩනැගිලි | 91,152 |
| 2002-02-99 පොලිය වෙනත් (ර.නි.අ.පො.) | 1,923,629 |
| (2003- 99 -000) අනෙකුත් ලැබීම් | 924,215 |
| **එකතුව** | **2,938,996** |

## 2015 ප්‍රාග්ධන වියදම්වල ප්‍රගතිය

| | ප්‍රතිපාදන රු. | වියදම රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| අනෙකුත් ප්‍රාග්ධන වැඩසටහන් | 77,872,000 | 53,479,904 | 68.68 % |
| **මිලියන 100 වැඩසටහන** | **100,000,000** | **87,429,587** | 87.43 % |
| **එකතුව** | **177,872,000** | **140,909,491** | 79.22 % |

## 2015 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන හා වියදම්

| ව්‍යාපෘති අංකය | වැය ශීර්ෂය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 1. | **2001** | ගොඩනැගිලි අලුත්වැඩියාව හා නවීකරණය | 2,000,000 | 635,313 |
| | **2002** | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව | 500,000 | 123,472 |
| | **2003** | වාහන අලුත්වැඩියාව | 800,000 | 791,351 |
| | **2102** | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 3,852,000 | 3,851,713 |
| | **2103** | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 500,000 | 489,589 |
| | **2401** | පුහුණු කිරීමේ හා හැකියා වර්ධනය | 570,000 | 526,481 |
| | | **උප එකතුව** | **8,222,000** | **6,417,919** |
| 2. | **2102** | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම ප්‍රා/ලේ | 8,500,000 | 5,053,669 |
| | **2401** | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 3,000,000 | 2,268,281 |
| | | **උප එකතුව** | **11,500,000** | **7,321,950** |
| 3. | **2001** | ගොඩනැගිලි අලුත්වැඩියාව හා නවීකරණය | 5,000,000 | 4,441,738 |
| | **2002** | යන්ත්‍රසූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව | 1,000,000 | 202,283 |
| | **2003** | වාහන අලුත්වැඩියාව | 2,050,000 | 1,977,835 |
| | **2101** | වාහන මිලදීගැනීම් | 2,000,000 | * |
| | **2102** | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 1,600,000 | 1,596,999 |
| | **2103** | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 1,500,000 | 942,762 |
| | **2104** | නව ඉදිකිරීම් | 3,000,000 | 1,398,070 |
| | **2401** | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 3,000,000 | 1,908,468 |
| | **2502 - 4** | ජයවිරු සෙවන පුළුල් කිරීම | 6,000,000 | 2,028,897 |
| | **2502 - 5** | ප්‍රජා මූලික පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 13,000,000 | 12,264,616 |
| | **2502 - 6** | වෘත්තීය පුහුණු ආයතන නවීකරණය | 100,000,000 | 87,429,587 |
| | **2502- 7** | *සංවර්ධන වැඩ සටහන (අමාත්‍යාංශය) | 20,000,000 | 12,978,367 |
| | | **උප එකතුව** | **158,150,000** | **127,169,622** |
| | | **මුළු එකතුව** | **177,872,000** | **140,909,491** |

* ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අත්හිට වූ ප්‍රතිපාදන

**වැඩසටහන 02- සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපනය හා පුහුණු කිරිම් සේවා**
**වැය ශීර්ෂය - 2001 ගොඩනැගිලි අලුත්වැඩියාව හා නවීකරණය - 2015**

| වැය ශීර්ෂය | වැඩ සටහන | ප්‍රතිපාදන | වියදම |
|---|---|---|---|
| **2001** | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනයේ නිලනිවාසයේ Pantry කබඩ් අලුත්වැඩියා කිරීම | 60,693 | 4,441,738 |
| | I. නාවින්න ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ ඉදිරි පස මිදුල පස් අතුරා කොන්ක්‍රීට් ගල් අල්ලා වතුර බැස යාම සඳහා කාණුව සැකසීම.<br>II. තීන්ත ආලේප කිරීම.<br>III. අධිකාරි කාමරය කාපට් ඇතිරීම ප්‍රධාන ගේට්ටුව සකස් කිරීම .<br>IV. පැන්ට්‍රි කබඩ් සෑදීම.<br>V. ප්‍රධාන ගේටුවේ සිට ගොඩනැගිල්ල දක්වා වැහි ආවරණයක් සැකසීම.<br>VI. ආරක්ෂක කුටිය අලුත්වැඩියා කිරීම. | 4,294,648 | |
| | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ ජලනල පද්ධතිය අලුත්වැඩියාව | 18,675 | |
| | කැටවල වෘත්තීය පුහුණු ආයතනයේ - ජලනල පද්ධතිය අලුත්වැඩියාව<br>කැටවල ආයතනයේ යකඩ දැල් සෑදීම | 20,367<br>31,000 | |
| | කලවාන විහව් ආයතනයේ Sign Board සෑදීම<br>විදුලි රැහැන් ඇදීම | 15,800<br>20,163 | |
| | **එකතුව** | **4,461,347** | **4,441,738** |

**වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපනය හා පුහුණු කිරිම් සේවා**
**වැය ශීර්ෂය 2104 - නව ඉදිකිරීම් - 2015**

| වැය ශීර්ෂය | වැඩ සටහන | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 2104 | අමුණුකුඹුර ආයතනයේ නිලධාරින් සඳහා වැසිකිළි 02 ක් සෑදීම | 406,619 | 1,398,070 |
| | මාදම්පෙ ආයතනයේ ප්‍රධාන ගේට්ටුව සමඟ ඉදිරි බැම්ම හා ආරක්ෂක කුටිය ඉදිකිරිම | 1,079,928 | |
| | **එකතුව** | **2,686,548** | **1,398,070** |

## මිලියන 100 ව්‍යාපෘතියේ ප්‍රගතිය- වැය ශීර්ෂය 6- 2502

✓ **ආබාධ සහිත වූවන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතන නවීකරණය කිරීම**

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | ප්‍රධාන ගොඩනැගිල්ල (කාර්යාල පුහුණු අංශය) අලුත්වැඩියා කිරීම - තෙළඹුයාය | 8,845,562 | 80,090,346 |
| 02. | සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම - තෙළඹුයාය | 1,696,385 | |
| 03. | ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම - තෙළඹුයාය අවිච්ඡේද | 2,104,000 | |
| 04. | නිල නිවාස 06ක් අලුත්වැඩියා කිරීම - තෙළඹුයාය | 4,576,335 | |
| 05. | ඇතුල්වීමේ දොරටුව සකස් කිරීම - තෙළඹුයාය | 660,838 | |
| 06. | වෘත්තීය පුහුණු අංශ අලුත්වැඩියා කිරීම (වඩුවැඩ අංශය - සීදූව) | 5,533,794 | |
| 07. | මැහුම් අංශය අලුත්වැඩියා කිරීම - සීදූව | 4,006,989 | |
| 08. | ප්‍රධාන ගබඩා නවීකරණය - සීදූව | 14,200 | |
| 09. | කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම - සීදූව | 5,400,927 | |
| 10. | කෘෂිකර්ම අංශය අලුත්වැඩියා කිරීම - අමුණුකුඹුර | 2,173,657 | |
| 11. | පාර අයිනේ පරණ ගරාජ් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම - අමුණුකුඹුර | 3,266,896 | |
| 12. | ආරක්ෂිත ගෘහය සඳහා ජල සම්බන්ධතාව ලබා ගැනීම- අමුණුකුඹුර | 57,148 | |
| 13. | ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම,බී නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම - අමුණුකුඹුර | 11,451.037 | |
| 14. | නේවාසිකාගාරයේ පැති බැම්ම ඉදිකිරීම - කැටවල | 1,864,800 | |
| 15. | දැව ගබඩාව අලුත්වැඩියා කිරීම - කැටවල | 850,815 | |
| 16. | පරිශ්‍රය වටා වැට සකස් කිරීම - කැටවල | 5,014,680 | |
| 17. | නේවාසිකාගාරය වටා වැට සකස් කිරීම - කැටවල | 2,428,902 | |
| 18. | නේවාසිකාගාරය සඳහා පඩිපෙළ සකස් කිරීම - කැටවල | 311,654 | |
| 19. | ප්‍රධාන ගේට්ටු කණු ඉදිකිරීම - කැටවල | 104,197 | |
| 20 | ගබඩාව අලුත්වැඩියා කිරීම -කැටවල | 1,446,618 | |
| 21. | වෘත්තීය පුහුණු ආයතනයේ ගැහැණු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම- වත්තේගම | 4,337,777 | |
| 22. | පිරිමි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම හා පොදු ශාලාව සකස් කිරීම - වත්තේගම | 8,811,413 | |
| 23. | දොරවල් අලුත්වැඩියා කිරීම - වත්තේගම | 72,450 | |
| 24. | අවිච්ඡේද වියදම (වැසිකිළි පද්ධතිය) - පුවක්පිටිය | 1,603,313 | |
| 25. | පාලිකා නිල නිවසය අලුත්වැඩියා කිරීම හා ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම ටයිල් ඇල්ලීම - පුවක්පිටිය | 5,301,859 | |
| 26. | ජල සම්බන්ධතාවය ලබා ගැනීම හා නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම - කලවාන | 4,058,853 | |
| 27. | මැහුම් කාමරය සහ වඩු අංශය දොර ජනෙල් අලුත්වැඩියා කිරීම - සීදූව | 2,960,250 | |

✓ **භාණ්ඩ මිල දී ගැනීම**

| අනු අංකය | | |
|---|---|---|
| 01. | ඒකල ඇඳන් - 120 | 1,458,000 |
| 02. | ලොකර්ස් - 65 | 658,224 |
| 03. | ලොබි සෙට්ස් - 08 | 72,952 |
| 04. | ලොකර්ස් - 285 | 2,886,061 |
| 05. | වානේ තට්ටු ඇඳන් - 20 | 528,360 |
| 06. | බ්ලෙන්ඩර් - 01 | 7,200 |
| 07. | කෑම මේස පුටු - 120, මේස - 20 | 911,000 |
| 08. | උදලු - 03, අත්පොරව - 02, විල්බැරෝ - 02, මල්ගස් කපන කතුරු 01 | 12,500 |
| 09. | බංකු නිමැදුම් යන්ත්‍රය ,ඩයමන් බිල් ඩ්‍රෙස | 41,400 |
| 10. | කම්බයින් පපින් මැෂින් 01 , මහන මැෂින් - 02 | 257,000 |
| 11. | මෙට්ට | 438,900 |
| 12. | විදුලි හිරමන -01 | 6,500 |
| 13. | වෙනත් මිල දී ගැනීම් | 61,144 |
| | **එකතුව** | **7,339,241** |

**සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - වැය ශීර්ෂය -7 - 2502**

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය මගින් 2015 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන විස්සක් ලබා දී ඇත.

| අනු අංකය | කාර්ය | සත්‍ය වියදම |
|---|---|---|
| 01. | කුසලතා සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 100ක ආබාධසහිත පුද්ගලයන් සඳහා ස්වයංරැකියා පුහුණුව සඳහා ප්‍රතිපාදන ලබාදීම. | 12,970,000 |
| 02. | දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල සාර්ථක ලෙස පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් අතුරින් තෝරාගත් පිරිසක් සඳහා නිෂ්පාදන ක්‍රියාවලියක් ඇති කිරීම. (Shelter Work Shop ) | |
| 03. | දිවයිනේ ආබාධ සහිත දරුදැරියන් සඳහා 2015/12/22 දින **"මලල ක්‍රීඩා තරඟයක්"** හෝමාගම**,** දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී පැවැත්වීම | |
| 04. | දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සඳහා බත්තරමුල්ල **"අපේගම"** පරිශ්‍රයේ දී **"සිත් රූ - 2015"** කලා උළෙලක් 2015/12/10 දින පැවැත්වීම | |
| 05. | මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර කොට්ඨාසයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආබාධ සහිත දරුදැරියන් සඳහා ආරම්භ කරන ලද කුසලතා සංවර්ධන මධ්‍යස්ථානවල සුළු අලුත්වැඩියා හා පුහුණු කටයුතු සඳහා අවශ්‍ය මෙවලම් සඳහා ප්‍රතිපාදන ලබාදීම. | |
| 06. | සිද්ධි අධ්‍යාන ඇතුලත් පින්කෙත සහ සඳමඬල පොත් දෙක මුද්‍රණය කිරීම. | |
| 07. | වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත ළමුන්ගේ ක්‍රියාකාරකම් ඇතුලත් වීඩියෝපට 03 ක් සකස් කිරීම. | |
| 08. | නාවින්න ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය සඳහා ව්‍යායාම උපකරණ සහ සංගීත උපකරණ ලබාදීම. | |

# 2 වන පරිච්ඡේදය

## ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහන

ආබාධ සහිත තත්ත්වයෙන් පසුවන තැනැත්තන් සඳහා සමාජයේ සමානත්වය හා සමාන සහභාගිත්වය ඇති කිරීම හා ඔවුන්ගේ අයිවාසිකම් සුරක්ෂිත කරමින්, ආත්ම ගරුත්වයෙන් යුතු අභිමානවත් පිරිසක් ලෙස ජීවත්වීමට අවශ්‍ය හිතකාමී පරිසරයක් නිර්මාණයකිරීමමෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථයයි. මෙම අරමුණ කරා ලඟාවීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නංවා ඇත.

විශේෂයෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම පමණක් නොව සෞඛ්‍ය අධ්‍යාපන වැනි මූලික අවශ්‍යතා මෙන්ම තාක්ෂණය හා සන්නිවේදනය, කලාව හා ක්‍රීඩාව පිළිබඳ ඔවුන්ට තිබෙන දැනුම, කුසලතාවන් හා අත්දැකීම් සෙසු ලෝකයත් සමඟ බෙදා හදා ගැනීමට අවශ්‍ය සමාජ වටපිටාවඉන් නිර්මාණය වේ.

**ප්‍රධාන ව්‍යාපෘති**

I. **ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම , සමාජගත කිරීම , රැකවරණය**
II. **මුල් ළමාවියේ දීම ඇතිවන අබාධිත තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත් වීම හා සංවර්ධනය කිරීම.**
III. **ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රජාමූලික අන්තර්කරණ සංවර්ධන ජාතික වැඩසටහන.**
IV. **දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන අරමුදල.**

### I. ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම හා සමාජගත කිරීම

කොළඹ , ගම්පහ, මහනුවර , පුත්තලම, රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 06 ක පිහිටුවා ඇති සීදූව ,අමුණුකුඹුර, රාගම, මාදම්පෙ, කැටවල, වත්තේගම ,විහවි හා තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතන යන වෘත්තීය පුහුණු ආයතන 08 ක් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ . පුහුණු පාඨමාලා සඳහා වයස අවු. 16 - 35 අතර ආබාධ සහිත දරුදැරියන් ඇතුලත් කරගනු ඇත. පුහුණු කාලය වසරක් පමණ වන අතර එම කාලය තුළ ඔවුනට අවශ්‍ය ආහාර පාන, නේවාසික පහසුකම් , සෞඛ්‍ය පහසුකම් හා පුහුණුව නොමිලයේ සැපයේ. අභ්‍යාසලාභීන්ගේ දෛනික අවශ්‍යතා සඳහා දීමනාවක් ද ලබා දෙනු ඇත. පුහුණුවට අමතරව ඔවුන්ගේ කලාකුසලතාවන් හා අනෙකුත් ක්‍රියාකාරකම් වැඩි දියුණු කරගැනීමට අවස්ථාව සැලසේ. විධිමත් පරිදි පුහුණුව අවසන් කරන අභ්‍යාසලාභීන් සඳහා වටිනා සහතික පත් හා ස්වයංරැකියා සඳහා මෙවලම් කට්ටල ලබා දෙනු ඇත. ඔවුන් ලබා ඇති පුහුණුව අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශවල රැකියා අවස්ථා හඳුන්වා දෙන අතර සමාජගත කරන අභ්‍යාසලාභීන්ගේ පසුහාර කටයුතු ආයතනවල නිලධාරින් විසින් සිදුකෙරේ.

වෘත්තීය පුහුණුව ලබා දීමට අමතරව ශ්‍රවයාබාධිත වූවන් සඳහා විශේෂ හැඳුනුම්පත් ලබාදීම, ආබාධ සහිත වූවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දෙන ස්වේච්ඡා ආයතනවල අභ්‍යාසලාභී දීමනා ලබාදීම, ශ්‍රවයාබාධිත

වූවන් හා සෙමෙන් මනස වැඩෙන ළමුන්හට අධ්‍යාපන ලබාදෙන පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා ලබාදීම, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ මුල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සමාජ ආයතන සඳහා නඩත්තු ආධාර හා යථායෝග්‍යාධාර ලබා දීම හා ශ්‍රවනාබාධිත වූවන් සඳහා සංඥා භාෂා සේවා ලබාදීම සිදු කෙරේ.

**<u>වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා</u>**

01. ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය
02. ශිතකරන හා වායු සමීකරණ කාර්මික ශිල්පය
03. වඩු කර්මික ශිල්පය
04. මහන යන්ත්‍ර ක්‍රියා කර වීම (කර්මාන්ත ශාලා )
05. හස්ත කර්මාන්ත ශිල්පය (උණ හා පොල් )
06. හස්ත කර්මාන්ත ශිල්පය (කොසු හා ඉදල් )
07. හස්ත කර්මාන්ත ශිල්පය (වේවැල් හා කොහු)
08. හස්ත කර්මාන්ත ශිල්පය (රෙදි නිර්මාණය )
09. ඇඳුම් මැසීමේ ශිල්පය
10. වෙල්ඩින් ශිල්පය
11. සම්බාහන චිකිත්සාව
12. පෙදරේරු කාර්මික ශිල්පය
13. මෝටර් රථ කාර්මික ශිල්පය
14. යන්ත්‍ර ශිල්පය
15. විදුලි ශිල්පය
16. මෝටර් රථ පින්තාරු ශිල්පය
17. පැස්සුම් ශිල්පය
18. සිමෙන්ති නිෂ්පාදන ශිල්පය
19. පාවහන් හා සම් කර්මාන්ත ශිල්පය
20. බතික් නිර්මාණ ශිල්පය
21. බේකරි හා ආහාර තාක්ෂණ ශිල්පය
22. ගෙවතු වගා කෘෂිකාර්මික ශිල්පය
23. පේෂකර්ම ශිල්පය
24. පරිගණක
25. ත්‍රිරෝද රථ කාර්මික ශිල්පය
26. ආයතන ඉලක්කගත රැකියා පුහුණුව

**ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහනේ මූලා ප්‍රගතිය -වැය ශීර්ෂය -1501**

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන මිලියන | වියදම මිලියන |
|---|---|---|---|
| 01. | සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන යටතේ ආබාධ සහිත තරුණ තරුණියන් 334ක් සඳහා පුහුණුව ලබාදීම හා ස්වේච්ඡා පුහුණුව ලබන 115 දෙනකු සඳහා අභ්‍යාසලාභී දීමනා ලබාදීම. | 29.200 | 21.601 |
| 02. | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා සේවා සැපයීම | | |
| 03. | පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන්ට වෘත්තීය මෙවලම් කට්ටල 284 ක් ලබාදීම. | | |
| 04. | ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබාදීම. | | |
| 05. | ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන 02 ක් සඳහා මූල්‍යාධාර සැපයීම. | | |
| 06. | ශ්‍රවයාබාධිත හා සෙමෙන් මනස වැඩෙන ළමුන්ගේ පෙරපාසල් ගුරුවන් 04 දෙනෙකු සඳහා දීමනා ලබාදීම. | | |
| 07. | ශ්‍රවයාබාධිත වූවන් සඳහා 752 ක් විශේෂ හැඳනුම්පත් නිකුත් කිරීම. | | |
| 08. | ශ්‍රවයාබාධිත වූවන් සඳහා සංඥා භාෂා සේවා ලබාදීම. | | |

- **සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභී සංඛ්‍යාව**

| අනු අංකය | ආයතනය | 2015 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | සීදුවවෘත්තීය පුහුණු ආයතනය | 75 |
| 02. | කැටවල වෘත්තීය පුහුණු ආයතනය | 18 |
| 03. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | 75 |
| 04. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | 63 |
| 05. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | 37 |
| 06. | රාගම වෘත්තීය පුහුණු ආයතනය | 16 |
| 07. | විහවි සංවර්ධන පදනම | 20 |
| 08. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | 30 |
| | එකතුව | *334 |

- **සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ස්වේච්ඡා ආතනවල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සඳහා දීමනා ලබාදීම**

| අනු අංකය | ආයතනය | 2015 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ආබාධිත පුද්ගල සංවර්ධන පදනම - බණ්ඩාරවෙල | 33 |
| 02. | ඉස්ලාමීය ආබාධිත ආයතනය - තිහාරිය | 07 |
| 03. | සර්වෝදය සුවසෙත ආයතනය | 09 |
| 04. | සහනය ආයතනය - කොළඹ - 08 | 25 |
| 05. | බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය | 16 |
| 06. | සුකිත වෘත්තීය පුහුණු ආයතනය - හොරණ | 15 |
| 07. | සවිය සංවර්ධන පදනම | 10 |

- **මූලාධාර සැපයූ ස්වේච්ඡා සංවිධාන**

| අනු අංකය | ආයතන | ප්‍රතිපාදන රු. |
|---|---|---|
| **01.** | බිහිරි සේවා මණ්ඩලය - රාජගිරිය | 40,000 |
| **02.** | ස්වර්ණදාම පදනම - දූන්කන්නාව | 60,000 |

- **පෙරපාසැල් ගුරුවරු 04 දෙනෙකු සඳහා මූලාධාර ලබා දීම.**

| අනුංකය | ආයතන | වියදම රු. |
|---|---|---|
| 01. | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෙර පාසල් ගරුවරු 02 | 240,000 |
| 02. | කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෙර පාසල් ගුරුවරු 02 | |

- **ජයවිරු සෙවන - (පුවක්පිටිය රැකවරණ නිවාසය)**

පුවක්පිටිය රැකවරණ ආයතනය මඟින් දෙමාපියන් හා භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් 50 දෙනෙකු සඳහා රැකවරණය හා නේවාසික පහසුකම් සැපයීමට හැක. 2015 වර්ෂයේ මන්ද මානසික පිරිමි ළමුන් 40 දෙනෙකු සඳහා සේවා සපයනු ලැබ තිබේ. මේ වන විට මන්ද මානසික ළමුන් ඇතුළත් කිරීමේ ඉල්ලීමක් ප්‍රමාණය වැඩි වීමේ ප්‍රවනතාවයක් ඇති බැවින් ආයතනය පුළුල් කළයුතු බව අවධාරණය විය.

## II. ළමා මාර්ගෝපදේශ ව්‍යාපෘතිය - ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය - මහරගම

ළමයෙකුගේ ළමාවියේ දී වර්ධනයේ කිසියම් වෙනසක් හෝ ප්‍රමාදයක් ඇති බවට සැක සහිත අවස්ථාවක දී හෝ ආබාධයක් ඇති බවට හඳුනාගත් විට යොමු විය යුත්තේ ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය වෙතයි. මෙම ආයතනයට ඇතුළත් කරන දරුවා සංවර්ධනය කිරීම සඳහා කල් ඇතිව මැදිහත්වීම, මූලික සේවා සැපයීම , අවශ්‍ය සෞඛ්‍ය, මුල් ළමාවිය අධ්‍යාපනය හා සුභසාධන සේවා සම්බන්ධීකරණය කිරීම මෙන්ම දෙමාපියන්ගේ මානසික තත්ත්වය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ..

මෙම ව්‍යාපෘතිය යටතේ සේවා සපයන ළමුන් මැනවින් සංවර්ධනය වූ පසු විශේෂ පාසල්වලට, විශේෂ අධ්‍යාපන ඒකකවලට හා සාමාන්‍ය පාසල්වලට අන්තර්කරණය කරනු ලබයි.

**අරමුණු**

- ළමා ආබාධ හඳුනා ගෙන කල් ඇතිව මැදිහත්හත්වීමේ වඩාත් ඵලදායි ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ආබාධ පසහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ ඇතුළත් සේවා ජාලය ශක්තිමත් කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.

- දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා ලබාදීම.
- ව්‍යාපෘතිය වෙනත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීම.

2015 වර්ෂයේ ළමුන් 111 ක් ලියාපදිංචි වී ඇත. එම ළමුන් සඳහා භෞතික , කථන, වෘත්තීය විකිත්සක සේවා ,අධ්‍යාපන හා වෙනත් සේවා ලබා දීමට හැකි වූ අතර ඔවුන්ගේ දෙමාපියන් 91 දෙනෙකු සඳහා උපදේශන සේවාලබාදීම , ළමුන් 09 දෙනෙකු සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා ද යොමු කිරීම සිදුකොට ඇත. 2015 වසරේ සිට දිවයිනේ සෙසු ප්‍රදේශවලට මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම සඳහා මූලික කටයුතු දැනටමත් සැලසුම් කර ඇත.

❖ **සේවාලාභීන් ආබාධ වර්ගය අනුව**

| අනු අංකය | ආබාධයේ ස්වභාවය | ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ඔටිෂම් - (Autism) | 25 |
| 02. | මස්තිෂ්ක - ආඝාතය - ( c p) | 05 |
| 03. | ඩවුන් සින්ඩ්රෝම - (Down Syndrome | 14 |
| 04. | වර්ධනය අඩුබව - (Global Development ) | 36 |
| 05. | කථන හා භාෂා ගැටළු - ( Speech Delay) | 12 |
| 06. | අධි ක්‍රියාකාරි - (Hyper Activity) | 06 |
| 07. | ශ්‍රවණ ඌණතා - ( Hearing Impairment) | 04 |
| 08. | මන්ද මානසික - (Mentally Retardation) | 04 |
| 09. | වෙනත් - (Other) | 05 |

❖ **සේවාලාභීන් වයස් මට්ටම් අනුව**

| අනු අංකය | වයස් මට්ටම | ළමුන් ගණන |
|---|---|---|
| 01. | 0 - 3 | 34 |
| 02. | 4 - 5 | 36 |
| 03. | 6 - 15 | 41 |
| 04. | 16ට වැඩි | - |

❖ **ආයතනයට යොමු වූ මාර්ගය**

| අනු අංකය | යොමුවූ ආකාරය | ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | සේවාලාභී දෙමාපියන් | 37 |
| 02. | රජයේ රෝහල්<br>රිජ්වේ ආර්යා ළමා රෝහල, | 23 |
| 03. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් | 07 |
| 04. | ආයතනයේ කාර්යය මණ්ඩලය | 01 |
| 05. | ආදර්ශක අන්තර්කරණ පෙර පාසල් ගුරුවරුන් මගින් | 27 |
| 06. | වෙනත් | 16 |

❖ එක් එක් අංශයේ ලබාදුන් මුළු සේවාවන් විස්තර

| අනු අංකය | ලබාදුන් සේවය | සේවා ළමුන් සංඛ්‍යාව | සේවා වාර ගණන |
|---|---|---|---|
| 01. | භෞත චිකිත්සක ප්‍රතිකාර | 116 | 465 |
| 02. | කථන චිකිත්සක ප්‍රතිකාර | 112 | 372 |
| 03. | වෘත්තීය චිකිත්සක ප්‍රතිකාර | 90 | 257 |
| 04. | අධ්‍යාපන අංශයේ පන්ති හා ළමා නිරීක්ෂණ | 209 | 5332 |
| 05. | උපදේශන සේවා | 91 | 107 |

❖ **2015** වර්ෂයේ ළමුන් හා දෙමාපියන් වෙනුවෙන් කළ වැඩසටහන් හා පුහුණු වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | දිනය | ස්ථානය | සහභිගි වූ සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|---|
| | **විශේෂ අවශ්‍යතා සහිත ළමුන් අන්තර්කරණ පෙර පාසල් ගුරු පුහුණු සහතික පත්‍ර හයමාසික පාඨමාලාව** | | | | |
| 01 | සංකල්ප පැහැදිලි කිරීම හා න්‍යායාත්මක දැනුම ලබාදීම සම්බන්ධ වැඩ මුළු | මාර්තු 13,14 | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 110 | 49,100 |
| | | ජුනි 13,14 | මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 70 | 70,925 |
| | | සැප්. 17,18 | රත්නපුර ආනන්ද මෛත්‍රී විහාරස්ථානය | 70 | 60,100 |
| | සී.ජී.සී. වැඩසටහන පැහැදිලි කිරීම හා නිරීක්ෂණය කිරීම | පෙ.බ. 14 | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය | 19 | 4,955 |
| | | අගෝ. 04 | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය | 80 | 18,070 |
| | | **ඔක්. 13** | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය - රත්නපුර | 70 | 28,100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ළමුන්ගේ වර්ධන මට්ටම අවබෝධ කර ගැනීම හා සුදුසු අරමුණු සකස් කිරීම පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික වැඩමුළුව | ජුනි 27 | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 40 | 26,340 |
| | | අගෝ. 22 | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය | 98 | 26,592 |
| **02.** | **සොබා දහම් ඇකඩමිය යටතේ වැඩසටහන** | | | | |
| | සොබාදහම් චිකිත්සක ඇකඩමිය යටතේ ප්‍රායෝගික වැඩසටහන් - 03 | අප්‍රේල් - 08 | පානදුර මුහුදු වෙරළ | 66 | 8,460 |
| | විහාර මහා දේවි උද්‍යානය පරිසරය ආශ්‍රිත විවිධ නිදහස් ක්‍රියාකාරකම් හා රස වින්දනාත්මක අත්දැකීම් ලබා දීම. | ජුලි 29 | විහාර මහා දේවී උද්‍යානය | 115 | 19,450 |
| | සේවාලාභීන් /දෙමාපියන් / කාර්ය මණ්ඩලය සඳහා සංගීත රසවින්දනය ලබාදීම | දෙසැ - 23 | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය | 63 | 10,125 |
| **03.** | **ආගමික වැඩසටහන** | | | | |
| | අටසිල් සමාදන් වීමේ හා භාවනා වැඩසටහන | මැයි.30 | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය | 50 | 5,000.00 |
| | සේවාලාභීන් , දෙමාපියන් හා කාර්ය මණ්ඩලය සෝමාවතී පුදබිම වන්දනා කිරීම | සැප්-03,04 | සෝමාවතී පුදබිම | 110 | 114, 000 |
| **04.** | **සෞඛ්‍ය වැඩසටහන** | | | | |
| | සේවාලාභීන්ගේ දෙමාපියන් හා කාර්ය මණ්ඩලය සඳහා ජංගම වෛද්‍ය සායනය | පෙබ .27 | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය | 161 | 12,700 |
| | ඇස් කණ්නාඩි ලබා දීමේ ජංගම වෛද්‍ය සායනය | ජුනි 25 | - එම - | 118 | 4,500 |
| **05.** | බුද්ධි ඌනතා සහිත පුද්ගලයින්ගේ ආසියා සමුළුව - නියෝජිතයින්ගේ නිරීක්ෂණ චාරිකාව | ඔක්. 06 | - එම - | 27 | 85,180 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **06.** | නේපාල සමාජ සේවා අමාත්‍යාංශ නිලධාරීන් හා සමාජ සේවා අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීම | අගෝ-26 | | 21 | 2,670 |

## III. ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රජාමූලීක අන්තර්කරණ සංවර්ධන ජාතික වැඩසටහන - CBID

**අරමුණ**

ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික ප්‍රතිපත්තියට අනුව, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර එම පුද්ගලයින්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් පවතින සමාජ ආර්ථික ක්‍රමය තුළ ජාතික සංවර්ධනයට දායක කර, ඔවුන්ගේ වගකීම් හා යුතුකම් ඉටු කිරීමට හැකිවනු පිණිස ඔවුන් දැනුමෙන් හා කුසලතාවලින් සවිබල ගැන්වීම

**ක්‍රියාකාරකම්**

- ආබාධ සහිත පුද්ගලයින් සහ එම පවුල්වල පුද්ගලයින් දැනුමෙන් ආකල්පවලින් හා ක්‍රියාකාරකම්වලින් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

- නිවාස , පෙරපාසල් , පාසල, විශ්වවිද්‍යාලය, සේවා ස්ථාන තුළ ස්වාධීන පුද්ගලයෙකු ලෙසට කටයුතු කිරිම සඳහා ස්වේච්ඡා සේවකයින් මගින් දෛනික ක්‍රියාකාරකම් පුහුණුව .

- අන්තර්කර්ණ අධ්‍යාපන ක්‍රමය තුළ හෝ විශේෂ අධ්‍යාපන ක්‍රමය තුළින් මෙම ආබාධ සහිත දරුවන්ට අධ්‍යාපන අවස්ථා ලැබීම සඳහා යොමු කිරිම ඇතුළු අනෙකුත් සේවාවන් සඳහා යොමු කිරිම.

- ආර්ථිකය සවිබලගැන්වීම සඳහා කම්කරු අමාත්‍යාංශය හා පෞද්ගලික අංශය සමග එකාබද්ධව රැකියා අවස්ථා ලැබීම සඳහා යොමු කිරීම ඇතුළු අනෙකුත් සේවාවන් සඳහා පූර්ව සූදානම් කිරිම

- ප්‍රාදේශීය මට්ටමේ හෝ ජාතික මට්ටමේ වෘත්තීය පුහුණු ආයතන හරහා වෘත්තීය පුහුණුව ලබාදීමට කටයුතු කිරීම.

- අනෙකුත්අමාත්‍යාංශ,දෙපාර්තමේන්තවල පවතින වැඩසටහන්වලට ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය කිරිම - (ක්‍රීඩා, සංස්කෘතික වැනි)

- විවිධ ආගමික,සංස්කෘතික හා සමාජීය වැඩසටහන්වලට සක්‍රීය ලෙස සහභාගි කරවීම.

| ප්‍රජාමූලික පුනරුත්ථාපනවැඩසටහන -2015<br>භෞතික ප්‍රගතිය | | |
|---|---|---|
| 1. | නිවෙස් මට්ටමේ පුනරුත්ථාපනය | 13854 |
| 2. | සමාජගත කිරීම් | 3791 |
| 3. | පෙර පාසැල් වෙත යොමු කළ සංඛ්‍යාව | 963 |
| 4. | සාමාන්‍ය පාසැල් වෙත යොමු කළ සංඛ්‍යාව | 924 |
| 5. | විශේෂ පාසැල් වෙත යොමු කළ සංඛ්‍යාව | 938 |
| 6. | චිකිත්සක සේවා සඳහා යොමු කිරීම් | 5492 |
| 7. | වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම් | 2556 |
| 8. | රැකියා සඳහා යොමු කිරීම් | 909 |
| 9. | ස්වයං රැකියා සඳහා යොමු කිරීම් | 4524 |
| 10. | සෘජු ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව | 255 |
| 11. | ස්වශක්ති කණ්ඩායම් බලගැන්වීම | 1988 |

❖ **2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව සීබීආර් වැඩසටහන සඳහා මිලියන 13 ක ප්‍රතිපාදන ලබාදී ඇත.**

**මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | කාර්ය | වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | මූලික කණ්ඩායම් නිලධාරීන් සඳහා වැඩමුළු | 3,544,000 | වැඩසටහන් 16<br>සහභාගි වූ සංඛ්‍යාව - 448 |
| | ස්වශක්ති කණ්ඩායම් නිලධාරින් සඳහා වැඩමුළු | | වැඩසටහන් 208<br>සහභාගි වූ සංඛ්‍යාව -4576 |
| | ප්‍රජානායකයින් සඳහා වැඩමුළු | | වැඩසටහන් 93<br>සහභාගි වූ සංඛ්‍යාව -2325 |
| | ක්ෂේත්‍ර නිලධාරින් සඳහා සංඥා භාෂා වැඩමුළු | | වැඩසටහන් 04<br>සහභාගි වූ සංඛ්‍යාව -191 |
| | දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරින් සඳහා වැඩමුළු | | වැඩසටහන් 11<br>සහභාගි වූ සංඛ්‍යාව -275 |
| 02. | ආබාධ සහිත වූවන් සඳහා ආධාරක උපකරණ ලබාදීම | 3,800,000 | කොමඩ් වැසිකිළි ,ප්‍රවේශ පහසුකම් වෙනත් උපකරණ 255දෙනෙකු සඳහා ලබාදීම |
| 03. | සී.බී.ආර් අත්පොත මුද්‍රණය කිරීම | - | - |
| 04. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සී.බී.ආර් වැඩසටහනෙහි පසුහාර කටයුතු සහ අධීක්ෂණය කිරීමත් ස්වශක්ති කණ්ඩායම්වල පසුහාර කටයුතු හා අධීක්ෂණය කිරීම (ප්‍රාදේශීය | 2,906,000 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331 |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාල 331ට රු.10,000,00 බැගින් ප්‍රතිපාදන ලබාදීම) | | |
| 05. | තොරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨා25 ක ආදර්ශක වැඩ සටහන ක්‍රියාත්මක කිරීම | 1,300,000 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25 යි. |
| 06. | ස්වශක්ති කණ්ඩායම් හා ස්වේච්ඡා කණ්ඩායම් බලගැන්වීමේ වැඩමුළු | 548,000 | වැඩ සටහන් 22 යි |
| 07. | ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් සමාලෝජනය හා ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම | 152,000 | වැඩ සටහන් 05 යි |
| 08. | සී.බී.ආර් වැඩසටහනේ අවු.25 ක් පිරීම නිමිත්තෙන් පවත්වන උත්සවය | - | - |
| 09. | වෘත්තීය පුහුණුව සඳහා අහාසලාභීණ් බඳවාගැනීමේ වැඩමුළු සහ ස්වශක්ති කණ්ඩායම් ඇගයීමේ වැඩසටහන | - | දිස්ත්‍රික් 25 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331 යි |
| | **එකතුව** | **12,250,000** | |

## IV. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ විවිධ සේවාවන් ආරම්භ කරන ලදි.

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙම අරමුදලේ මෙහෙවර වේ. ආබාධ සහිත පුද්ගලයන් සඳහා සමාන අවස්ථා ලබාදීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මඟින් සම්මත කරගත් නීති රීතිවලට අදාළව කටයුතු කිරීම විශේෂත්වයයි.

**අරමුණු**

- දෘශ්‍යාබාධිත පුද්ලයින් සඳහා අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු පහසුකම් සැලසීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට ස්වයංරැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශන සැපයීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින් විසින් නිෂ්පාදන කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම.
- සමාන අයිතිවාසිකම් හා සමාන අවස්ථා ලබා ගැනීමට දෘශ්‍යාබාධිත තැනැත්තන් වළක්වාලන තත්ත්වයන් ඉවත් කිරීමට ක්‍රියා කිරීම.

**දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ ප්‍රධාන කාර්යයන්**

I. **ක්‍රීඩා දක්ෂතා** වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ආධාර ලබාදීම.
II. අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර සැපයීම.
III. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීම.
IV. උසස්පෙළ හදාරන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා මුදල් ආධාර ලබාදීම.
V. අඩු ආදායම්ලාභීන්ට නොමිලයේ අක්ෂිකාච ලබාදීම.
VI. අන්ධභාවය වැළැක්වීම සඳහා වෛද්‍ය ආධාර සැපයීම.
VII. චලතාවය හා දිශානතිය පුහුණුව ලබාදීම සඳහා උපදේශන දීමනා ලබාදීම.
VIII. දෘශ්‍යාබාධිත කාන්තා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

**දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩ සටහන | ඇස්තමේන්තු මුදල (රු.) | වියදම (රු.) | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 01. | ක්‍රීඩා ආධාර | 150,000 | | දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම |
| 02. | පුනරුත්ථාපන ආධාර | 1,500,000 | 1,475,000 | **I.** අන්ධජන සේවා මණ්ඩලය -16 දෙනෙකු සඳහා දිසානතිය , චලතාවය,ඉංග්‍රීසි ...... පුහුණුව ලබාදීම වෙනුවෙන් උපදේශන දීමනා 07 දෙනෙකුට ලබාදීම<br>II. දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය - පාලිකා 02 , උපදේශකවරු 01, නේවාසික කාන්තාවන් 12 දිමනා ලබාදීම.<br>III. දෘශ්‍යාබාධිත උපාධිධාරි මණ්ඩලය- වැඩසටහන් සඳහා දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් 70 දෙනෙකු , දේශකවරයෙකු හා සහයක 04 සඳහා සහභාගිත්ව දීමනා ලබා දීම. |
| 03. | අධ්‍යාපන හා සංස්කෘතික ආධාර | 2,000,000 | 2,000,000 | I. උසස් පෙළ 05 ශිෂ්‍යත්ව ලබාදීම.<br>II. විශ්වවිද්‍යාල සිසුන් 60 ශිෂ්‍යත්ව ලබාදීම.<br>III. සංගීත ගුරුවරු 01 උපදේශක දීමනා ලබාදීම.<br>IV. වාර්ෂික කාලය සඟරාව සැකසුම සඳහා ප්‍රතිපාදන ලබාදීම.<br>V. දැස් නොපෙනෙන දෙමාපියන්ගේ දැස් පෙනෙන දරුවන් 130 අධ්‍යාපන ආධාර ලබාදීම. |
| 04. | පරිපාලන වියදම් | 900,000 | 807,000 | - |

| | | | | |
|---|---|---|---|---|
| 05. | අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර | 1,700,000 | 1,384,000 | 176 දෙනෙකු සඳහා අක්ෂි කාච ලබාදීම |
| 06. | දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය | 400,000 | 230,000 | එක් උපදේශිකාවක් , සහායිකාවක් හා දෘශ්‍යාබාධිත කාන්තාවන් 04 දෙනෙකු සඳහා දීමනා ලබාදීම. |
| 07. | වෘත්තීය පුහුණුව | 250,000 | 124,000 | උපදේශකයින් දෙදෙනෙකු සඳහා උපදේශන දීමනා ලබාදීම. |
| 08. | විගණන ගාස්තු | 25,000 | 21,000 | - |
| 09. | මූල්‍ය වියදම් | 30,000 | 8,000 | - |
| 10. | විවිධ වියදම් | 45,000 | 13,000 | - |
| | **එකතුව** | **7,000,000** | **6,062,000** | |

# 3 වන පරිච්ඡේදය

## මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන පූවක්පිටිය සමාධි නිවහන, මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම සිදුකෙරේ.නිවහනට ඇතුළත්වන මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපන කිරීම , විෂහරනය කිරීම හා තම හැකියාන් වර්ධනය කිරීම මූලිකව සිදු කෙරේ. මනෝ චිකිත්සක, මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේදයන් හා වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ මතට ගොදුරු වූවන් හා අවදානම් කණ්ඩායම් ඉන් මුදවාගැනීමේ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස මෙම ආයතනය සංවර්ධනය කොට ඇත.

සමාධි නිවහනට ඇතුළත් වන අභ්‍යාසලාභීන්ගේ මානසික මෙන්ම අධ්‍යාත්මික සංවර්ධනය සඳහා යෝගී හා භාවනා වැඩසටහන් පැවත්වීම, විවේක කාලය ඵලදායී ලෙස ගත කිරීමට අවස්ථාව සැලසීම සඳහා කෘෂිකර්මාන්තයේ හා සත්ත්වපාලන කටයුතුවල යෙදීම ,අභ්‍යාසලාභීන්ගේ සුහදතාව වර්ධනය කිරීම මෙන්ම සංස්කෘතික හා කලාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම, මෙම වැඩසටහන් තුළින් අපේක්ෂා කරනු ලැබේ. ඔවුන්ගේ හැකියාවන් සවිබලගැන්වීම සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කොට ඇත.

මීට අමතරව 2015 වර්ෂයේ මතට ඇබ්බැහිවූවන් 40දෙනෙකු පුරුත්ථාපනය කිරීමෙන් අනතුරුව සමාජ ගත කර ඇත. සමාධි නිවහනට ඇතුළත් වන මතට ඇබ්බැහිවූවන් නේවාසිකව සිට පුනරුත්ථාපන විෂහරනය හා හැකියා ප්‍රවර්ධනය කටයුතු සිදු කළයුතුය. මතට ඇබ්බැහිවූවන් නේවාසිකව සිටින කාලය තුළ ආහාර පාන නේවාසික පහසුකම් හා වෛද්‍ය පසුකම් නොමිලයේ සිදුකෙරේ.

2015 වර්ෂයේ මත් නිවාරණ හා පුනරුත්ථාපන ප්‍රජා ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්කයකට එක් ව්‍යාපෘතිය බැගින් නියාමක ව්‍යාපෘති 25ක් ක්‍රියාත්මක කිරීම සඳහා උපරිමය රු.80,000.00ක් දක්වා ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර ඇත. දෙපාර්තමේන්තු ක්ෂේත්‍රනිලධාරීන් සඳහා මත් නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ තෙදින වැඩමුළු පැවැත්වීම හා ඒ සම්බන්ධ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම ද සිදු කොට ඇත . ඒ සඳහා මිලියන 3.000ක් වෙන්කර ඇති අතර මිලියන 2.096 වැය කොට ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් ක්‍රියාත්මක කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨශය | ලබාදුන් ප්‍රතිපාදන රු. |
|---|---|---|---|
| 01. | අනුරාධපුර | කැකිරාව | 76,800 |
| 02. | කුරුණෑගල | කුලියාපිටිය - නැගෙනහිර | 46,500 |
| 03. | රත්නපුර | ඇළපාත | 29,400 |
| 04. | කළුතර | හොරණ | 80,000 |
| 05. | ගම්පහ | අත්තනගල්ල | 80,000 |
| 06. | ගාල්ල | හික්කඩුව | 54,500 |
| 07. | පුත්තලම | මාදම්පේ | 95,000 |
| 08. | කිලිනොච්චිය | කණ්ඩාවල | 80,000 |
| 09. | හම්බන්තොට | බෙලිඅත්ත | 50,000 |
| 10. | කොළඹ | කොලොන්නාව | 83,560 |
| 11. | මොණරාගල | වැල්ලවාය | 80,000 |
| 12. | මාතර | දෙවිනුවර | 68,100 |
| 13. | පොළොන්නරුව | ඇලහැර | 80,000 |
| 14. | මහනුවර | ගඟවට කෝරලේ | 80,000 |
| 15. | මාතලේ | යටවත්ත | 76,000 |
| 16. | බදුල්ල | ඌව පරණගම | 80,000 |

| | | | |
|---|---|---|---|
| 17. | ත්‍රිකුණාමලය | තඹලගමුව | 80,000 |
| 18. | නුවරඑළිය | කොත්මලේ | 80,000 |
| 19. | කෑගල්ල | යටියන්තොට | 80,000 |
| 20. | යාපනය | යාපනය | 80,000 |
| 21. | මඩකලපුව | මන්මුණෙයි දකුණ | 80,000 |
| 22. | වව්නියාව | වව්නියාව | 50,000 |
| 23. | අම්පාර | අම්පාර | 79,000. |

## 4 වන පරිච්ඡේදය

- **2015 වර්ෂයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩ සටහන් හා පුහුණු පාඨමාලා**

| අනු අංකය | වැඩසටහන | ස්ථානය | දිනය | සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01. | අධිකාරි ,ස්ථානභාර නිලධාරීන් ,උපදේශකවරුන් සඳහා වැඩමුළුව | ප්‍රධාන කාර්යාලයේ | 01/12-13 | 75 | 36,263 |
| 02. | දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුව | - එම - | 04/06 | 55 | 6,136 |
| 03. | ගබඩා කළමනාකරණය පිළිබඳව වෘත්තීය පුහුණු ආයතනවල ගබඩා භාරකරුවන් හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් | - එම - | 04/28 | 35 | 8,753 |
| 04. | වෘත්තීය උපදේශකවරු සඳහා වෘත්තීය උපදේශනා වැඩසටහන | තලාහේන ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානය | 07/06 -08 | 60 | 160,035 |
| 05. | කළුතර ,ගාල්ල,බදුල්ල ,හම්බන්තොට සමාජ සේවා නිලධාරීන් /සමාජ සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව | සමනලවැව දිවිනැගුම පුහුණු මධ්‍යස්ථානය | 10/08 -09 | 75 | 185,032 |
| 06. | අම්පාර,කුරුණෑගල, ගම්පහ, නුවරඑළිය සමාජ සේවා නිලධාරීන් /සමාජ සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව | පිළිමතලාව ග්‍රාම සංවර්ධන පුහුණු පාර්යේෂණආයතනය | 10/22-23 | 100 | 274,587 |
| 07. | මාතර,මොණරාගල, කොළඹ ,කෑගල්ල සමාජ සේවා නිලධාරීන් /සමාජ සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව | ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය | 10/29-30 | 125 | 210,027 |
| 08. | පුත්තලම,මාතලේ, පොළොන්නරුව,අනුරාධපුර සමාජ සේවා නිලධාරීන් /සමාජ සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව | වයඹ පුහුණු මධ්‍යස්ථානය | 11/19/20 | 80 | 188,924 |
| 09. | මඩකලපුව,ත්‍රිකුණාමලය යාපනය , කිලිනොච්චිය, මුලතිව් ,මන්නාරම සමාජ සේවා නිලධාරීන් /සමාජ සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව | යාපනය, පන්ඩත්තරිප්පු Reteat House | 12/17-18 | 70 | 201,300 |

- **2015 වර්ෂයේ පුහුණු පාඨමාලා**

| අනු අංකය | වැඩසටහන | ස්ථානය | සහභාගී වූ පිරිස් | සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01. | මුදල් ප්‍රවාහය හා මුදල් කළමණාකරනය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | SDFL | එම්. එස්. සල්ගාදු එම්. ජී. ඒ. එල්. එම්. පෙරේරා | 02 | 17,000 |
| 02. | අරමුදල් ගොඩනැංවීම(Fundraising) සම්මන්ත්‍රනය | Centre for Advancement of Resources Mobilization | ධම්මික වාසල බණ්ඩාර | 01 | 12,000 |
| 03. | රාජ්‍ය කළමනාරණය පිළිබඳ ශාස්ත්‍රීය උපාධි පාඨමාලාව | SLIDA | අතිරේක අධ්‍යක්ෂ සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 | 135,000 |
| 04. | වෘත්තීය උපදේශක වරයෙකු හා ළමා සංවර්ධන සහකාර දෙදෙනෙකු සඳහා ජාතික සමාජ සවර්ධන ආයතනයේ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ පාඨමාලාව | | | | 34,500 |
| 05. | සමාජ සේවා නිලධාරී, සමාජ සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී, පෙර පාසල් ගුරු, නිලධාරීන් සඳහා පශ්චාත් උපාධී/ ඩිප්ලෝමා පාඨමාලා | | | | 288,200 |
| 06. | National Diploma in Business communication | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සහකාර අධ්‍යක්ෂ සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 | 40,000 |

- **2015 වර්ෂයේ විදේශ ශිෂ්‍යත්ව**

| නිලධාරියාගේ නම | දිනය | විදේශීය රට |
|---|---|---|
| අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මිය | 2015/02/28 | මැලේසියාව |
| ශ්‍රීමති රාධා නානායක්කාර මිය | 2015/07/14 | චීනය |
| චමිමි නිශාරා ඩයස් මිය | 2015/07/27 | තුර්කිය |
| පී.ජී. ප්‍රසන්න සේන කුමාර මයා | 2015/08/27 | ඉන්දියාව |
| එච්.එම්. ජයන්ත ප්‍රේමලාල් මයා | | |
| එච්.කේ. රංජිත් උදයසිරි මයා | 2015/10/11 | කොරියාව (කොයිකා) |
| කේ.එම්.ජී.එල්. දිසානායක මයා | | |
| ඩබ්.ඩබ්. ජී.සී. මහේෂ් මයා | | |
| ඩබ්.ඩබ්.දේවිකා දසනායක මිය | | |
| ඩබ්.ජී.පී. එම්. විරක්කොඩි මයා | | |
| පී.ජී. සන්ධ්‍යා නිලන්ති මිය | | |
| බී.කේ.එස්.එම්.ශ්‍යාමා සමරවීර මිය | | |
| ජී.ටී.පවිත්‍රා ක්‍රිශාන්ති මිය | | |
| පි.අයි. ජයසුන්දර මයා | | |

| | | |
|---|---|---|
| ඩී.එස්.කේ. ඇතුලත්මුදලි මයා<br>ජී.එස්. අනුර බණ්ඩාර මයා<br>ජේ.ජී.ආර්. සංජීව ජයතිලක මයා<br>ඩී.තරංග මනෝජ් කරුණාදාස මයා | | |
| කේ.පී.ප්‍රේමරත්න මයා<br>එම්.ආර්. ශාන්ත කුමාර මයා | **2015/10/21** | චීනය |
| ඩබ්.ආර්.එම්.ඩී. වාසල බණ්ඩාර මයා<br>එම්.ආර්.පී.බී. ධර්මපාල මයා | **2015/12/03** | නේපාලය |
| ප්‍රදීප් යසරත්න මයා<br>ආර්.එම්. දයාරත්න මයා | **2015/12/11** | බංගලාදේශය |

# 5 වන පරිච්ඡේදය

**විදේශ ආධාර ව්‍යාපෘතිය**

2014 වර්ෂයේ ලෝක බැංකු ආධාර ඇතිව , "**දිරිසවිය ව්‍යාපෘතිය**" මගින් මන්නාරම,යාපනය, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව්ව,අනුරාධපුරය , පුත්තලම හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරනු ලබන ආබාධ සහිත වූවන් සඳහා වන වෘත්තීය පුහුණු වැඩසටහන 2015/05/31නිමකළ අතර එහි ප්‍රගතිය පහත සදහන් වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආයතනය | පාඨමාලාව | අභ්‍යාස ලාභීන් සංඛ්‍යාව | ගිවිසුම්ගත මුදල රු. | වියදම රු. |
|---|---|---|---|---|---|---|
| 01. | මන්නාරම | ආබාධ සහිත වූවන් සඳහා වන සංවිධානය මන්නාරම(MARDAP) | ඉටිපන්දම් හා හඳුන්කූරු සෑදීම | 20 | 3,300,900 | 3,041,319 |
| 02. | යාපනය | ආබාධ සහිත වූවන් පුනරුත්ථාපනය කිරීමේ සංවිධානය (AROD) | චූල් වැඩ හා පාපිසි නිෂ්පාදනය | 20 | 2,651,000 | 2,105,992 |
| 03. | කිලිනොච්චිය | තාක්ෂණ අධ්‍යාපන ආයතනය | ජංගම දූරකථන අලුත්වැඩියාව, ඇඳුම් මැසීම | 40 | 5,413,100 | 5,065,961 |
| 04. | වව්නියාව | ආබාධ සහිතවූවන් සඳහා වූ වන්නි පුනරුත්ථාපන සංවිධානය | ලෙදර් නිෂ්පාදන | 19 | 2,632,300 | 2,160,043 |
| | | ආබාධ සහිත වූවන් සඳහා වූ පුනරුත්ථාපන සංවිධානය | පරිගණක චිත්‍රක ශිල්පය ( Graphic design) | 15 | 2,210,835 | 2,005,748 |
| 05. | අනුරාධපුරය | සමාජ සේවා දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත | පරිගණක අලුත් වැඩියාව | 09 | 5,679,300 | 1,605,308 |
| | | | පැළ තවාන් | 11 | | |
| | | | අත්කම් නිර්මාණ | 10 | | |
| 06. | පොළොන්නරුව | කඳුරට සමාජ හා ආර්ථික මධ්‍යස්ථානය | අත්කම් නිර්මාණ | 18 | 2,363,735 | 1,965,968 |
| 07. | මුලතිව් | ප්‍රජා සංවර්ධන සංවිධානය | ඇඳුම් මැසීම | 09 | 3,841,200 | 1,832,879 |
| | | | වයරින් කිරීම | 15 | | |
| 08. | පුත්තලම | Child Vision Sri Lanka | ඇඳුම් මැසීම | 16 | 5,308,050 | 4,020,455 |
| | | | ජංගම දූරකථන අලුත්වැඩියාව | 16 | | |
| 09. | ත්‍රිකුණාමලය | කින්නියා තාක්ෂණ ආයතනය | ඇඳුම් මැසීම හා අත්කම් නිර්මාණ | 17 | 2,592,700 | 2,036,581 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10. | මන්නාරම | ආබාධ සහිත වූවන් සඳහා වන සංවිධානය මන්නාරම(MARDAP) | අත්කම් නිර්මාණ | 20 | 839,500 | 783,500 |
| 11. | යාපනය | ආබාධ සහිත වූවන් පුනරුත්ථාපනය කිරීමේ සංවිධානය (AROD) | අත්කම් | 19 | 1,094,500 | 855,838 |
| 12. | වව්නියාව | ආබාධ සහිත වූවන් සඳහා වූ පුනරුත්ථාපන සංවිධානය | Computer Application Assistant | 20 | 1,309,990 | 993,523 |
| **එකතුව** | | | | **314** | **39,237,110** | **28,473,122** |

- "දිරිසවිය ව්‍යාපෘතිය" මගින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය පුහුණු වැඩසටහන යටතේ පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව ලබන කාලය තුළ එක් අභ්‍යාසලාභියෙකු සඳහා දිනකට රු.110/- බැගින් 314 දෙනෙකු සඳහා රු. 5,034,460 ක් ලබාදී ඇත. පුහුණුව නිමකරන ලද අභ්‍යාසලාභීන් සඳහා වටිනා සහතිකපත් හා පුහුණුවට අදාළ මෙවලම් කට්ටල ලබා දීම සිදු කර ඇත. ඒ සඳහා 4,175,067 වැය කර ඇත.

- මුළු දිවයිනම ආවරණය වන පරිදි සේවා සපයන්නන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා තෙදින පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා ඇත. සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන් 401ක් ඒ සඳහා සහභාගි විය.ඒ සඳහා රු.3,559,028

- "දිරිසවිය ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කවලින් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 80 ක් තුළ ආබාධ සහිත පුද්ගලයන් 3469ක් සඳහා ව්‍යවසායකත්ව කුසලතා එක් දින පුහුණු වැඩසටහන් පවත්වා ඇත. ඒ සඳහා රු. 3,732,795 වැය කොට ඇත.

**විශේෂ වැඩසටහන්**

- දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සඳහා 2015/04/24 වන දින නාරාහේන්පිට ශාලිකා ක්‍රීඩාංගනයේ දී බාහිර ආයතනවල මූල්‍ය දායකත්වයෙන් අවුරුදු උත්සවයක් පැවැත්වීම.
- දෙපාර්තමේන්තුවේ සියලුම අධිකාරිවරුන් ,ස්ථානභාර නිලධාරීන් ,උපදේශකවරුන් ,සමාජ සේවා නිලධාරීන් , සමාජ සංවර්ධන සහකාරවරුන් හා සංවර්ධන නිලධාරීන් සඳහා බත්තරමුල්ල **"අපේගම"** පරිශයේදී එක්දින වැඩමුළුවක් 2015/10/19 දිනපවත්වා ඇත.

- 2013 වර්ෂයේ දිරිසවිය ව්‍යාපෘතිය මගින් ආරම්භ කරන ලද, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන තෙළඹුයාය හා අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනවල ගොඩනැගිලිවල නව ඉදිකිරීම් සඳහා 2015 වර්ෂයේ රු.50,200,000ක් ලබා දීම.

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ඇගයුම් සහ මෙහෙයුම් ක්‍රියාවලිය

- කාර්ය මණ්ඩලය සඳහා දෙසති රැස්වීම - දෙසතියකට වරක්
- සමාජ සුභසාධන අධිකාරිවරුන්/ ස්ථානභාර නිලධාරීන්ගේ රැස්වීම - මාසිකව
- වෘත්තීය පුහුණු ආයතනවල කාර්ය මණ්ඩල රැස්වීම - මාසිකව
- දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන්ගේ රැස්වීම - මාසිකව
- පළාත් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම -ත්‍රෛමාසිකව
- පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම - සය මාසිකව

**Department of Social Services**
Second Floor
Sethsiripaya - Stage II
Battaramulla

Telephone : 0112187050
Fax : 0112186276
E - mail : dirss@sltnet.lk
dirssdss@gmail.com
Web Site : www.socialservices.gov.lk